# *2005 වර්ෂය සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ පාලන වාර්තාව*

## 1. හැඳින්වීම:

මුදල් අමාත්‍යංශයේ මෙහෙයවීම සහ මාර්ගෝපදේශකත්වය යටතේ සුරාබදු දෙපාර්තමේන්තුව, රජයේ ප්‍රතිපත්ති හා ඒවාට අදාල සුරාබදු ආදායම් සුරැකීම හා එකතු කිරීම ඇතුළු කටයුතු සඳහා නෛතික අධිකාරය ලැබෙන්නේ ප්‍රධාන වශයෙන්ම ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 52 වෙනි අධිකාරිය වන සුරාබදු ආඥා පණතෙනි. මේ හැරුණ විට, 1999 අංක 8 දරණ දුම්කොළ බදු පණතෙහි අධිකාරිය පවත්වා ගැනීමේ වගකීම හා පොලිස් හා වෙනත් අදාල නියෝජිතායතනයන් සමග, වස, විෂ, අබිං හා න්තරායකාරී ඖෂධ ආඥා පණතෙහි අධිකාරිය බලාත්මක කිරීමේ සාමූහික වගකීමද දෙපාර්තමේන්තුවට පැවරී ඇති අනිවාර්ය කාර්යයෝ ය. පූර්වෝක්ත ආඥා පණත් හා පණත්වල සහ ඒවාට අනුසාංගික නීති, රෙගුලාසි, නිවේදන, නියෝග හා විධාන ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ බලධාරී ප්‍රධාන පෙළේ නියෝජිතායතනයක් වශයෙන් මෙම දෙපාර්තමේන්තුව ක්‍රියා කරයි. රජයේ ආර්ථික සංවර්ධන කටයුතු සඳහා වැය කිරීමට ඉමහත් අය සම්භාරයක් රැස්කර දීමෙන් හා එකී ව්‍යවස්ථාවන් යටතේ ගැනෙන සෑම ආකාරයකම වැරදි වැලක්වීමෙන් හා ග්‍රහණය කිරීම තුලින් සමාජ ආරක්ෂාව සැලසීමෙහි සුවිශේෂ ජාතික මෙහෙවරක් ඉටු කිරීමේ කාර්යයක සුරාබදු දෙපාර්තමේන්තුව නිරත වෙයි.

## 2. දෙපාර්තමේන්තු මෙහෙවර

පුළුල් වශයෙන් යථෝක්ත මෙහෙවර වනුයේ ශ්‍රී ලංකාවේ සුරා හා දුම්කොළ කර්මාන්තයන්හි කාර්යක්ෂම පාලනයක් තුලින් ආදායම එකතු කිරීමෙනුත්, මෙකී කර්මාන්තවල නීත්‍යානුකූල නොවන නිෂ්පාදනයන් වැලැක්වීමෙනුත්, ශ්‍රී ලංකාවේ සංවර්ධනයට හා සමාජ සුභ සාධනයට දායකවීමත්, වස විෂ, අබිං අන්තරාදායක ඖෂධ ආඥා පණත ක්‍රියාත්මක කිරීමෙන් සමාජ ආරක්ෂාව ලබා දීමත් ය.

සුරාබදු දෙපාර්තමේන්තුවේ පරමාර්ථයන් පහත දැක්වෙන අන්දමට පුළුල් ලෙස හැඳින්විය හැක.

අ. මත්පැන් හා දුම්කොළ වලින් ලැබෙන ආදායම ආරකෂා කර ගැනීම.
ආ. සුරාබදු ආඥා පණත හා දුම්කොළ බදු පණත බලාත්මක කිරීම.
ඇ. වස, විෂ, අබිං අන්තරාදායක ඖෂධ ආඥා පණත ක්‍රියාත්මක කිරීම.

ඉහත සඳහන් අරමුණු සපුරාලීම සඳහා දෙපාර්තමේන්තුව මතු දැක්වෙන ආකාරයට ක්‍රියාත්මක වෙයි.

අ. බලපත්‍ර ලත් ස්ථාන අධීක්ෂණය , පාලනය හා ඒවායින් ලැබිය යුතු ආදායම එකතු කිරීම.
ආ. සුරාබදු ආඥා පණත සම්බන්ධයෙන් නීතිය බලාත්මක කිරීමේ නියෝජිත බලධාරියකු ලෙස කටයුතු කිරීම.
ඇ. දුම්කොළ නිෂ්පාදනාගාර අධීක්ෂණය හා පාලනය ඇතුළුව දුම්කොළ බදු පණත බලාත්මක කිරීම.
ඇ. වස, විෂ, අබිං අන්තරාදායක ඖෂධ ආඥා පණත බලාත්මක කිරීමේ නියෝජිත බලධාරියකු ලෙස කටයුතු කිරීම

## 3. සංවිධාන ව්‍යුහය

2005.12.31 වන දිනට කාර්ය මණ්ඩලය මෙසේ විය:-

| | | |
|---|---|---|
| සුරාබදු කොමසාරිස් ජනරාල් (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (පුහුණු / අපරාධ) (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (ආදායම් / පාලන) (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (මුදල්) (ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (පාලන) (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (මුදල්) (ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| සහකාර සුරාබදු කොමසාරිස් | : | 01 |
| සුරාබදු අධිකාරී | : | 11 |
| ප්‍රධාන සුරාබදු පරීක්ෂක | : | 45 |
| සුරාබදු පරීක්ෂක | : | 162 |
| සුරාබදු සැරයන් මේජර් | : | 28 |
| සුරාබදු සැරයන් | : | 54 |
| සුරාබදු නියාමක / කෝප්‍රල් | : | 514 |
| සුරාබදු රියදුරු | : | 61 |
| රාජ්‍ය කළමනාකාර සහකාර සේවය | : | 96 |
| අයවැය සහකාර | : | 01 |
| කාර්යාල සේවක සේවය | : | 41 |
| බංගලා භාරකරු | : | 02 |

## 4. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

ආදල වර්ෂය තුලදී මත්පැන් සඳහා වන බදු අනුපාතිකයන්ගේ වෙනසක් සිදු වුනි. මත්පැන් සඳහා අය කරන ලද සුරා බද්ද වැඩි කරන ලදී. එනිසා, මත්පැන් අලෙවි මිලෙහි වැඩිවීමක් සිදුවිය. නීති විරෝධි මත්පැන් නිෂ්පාදනය, අලෙවිය හා සම්බන්ධ ග්‍රහණ ද, වස, විෂ, අබිං හා අන්තරායකාරී ඖෂධ ආඥා පණත යටතේ කරනු ලබන ප්‍රහණයන්ද කාර්යක්ෂමව පවත්වා ගෙන යන ලදී.

## 5. මාණ්ඩලික වෙනස්කම්:

2005 වර්ෂය තුලදී පහත නම් සඳහන් නිලධාරී මහතා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

ටී. මහේන්ද්‍රන් මහතා - සහකාර සුරාබදු කොමසාරිස් - 2005.05.18

<u>2005 වර්ෂය තුල පහත සඳහන් උසස් කිරීම් සිදු කරන ලදී</u>

- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක පී/5/24/11/04 හා 2005.11.02 දිනැති ලිපියෙන් සහකාර සුරාබදු කොමසාරිස් එස්. සිවානන්දන් මහතා නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරට 2003.06.23 වන දින සිට පත් කරන ලදී.
- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක පී/2/24/77/98 හා 2005.09.04 දිනැති ලිපියෙන් සුරාබදු පරීක්ෂක ඩබ්ලිව්.ඒ.එම්.ඒ.බී අබේකෝන් මහතා ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරට 1997.07.17 දින සිට පත් කරන ලදී.

➢ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක පී/2/24/77/98 හා 2005.09.04 දිනැති ලිපියෙන් පහත නම් සඳහන් සුරාබදු පරීක්ෂකවරුන් ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරට 2002.09.16 දින සිට පත් කරන ලදී.

I. සී.ජේ.ඒ වීරක්කොඩි මහතා
II. කේ.ජී.එම්.බී.ආර් විජේරත්න මහතා
III. ආර්.එම්.එස්.පී.ඒ.කේ රත්නායක මහතා
IV. එච්. අරුණ ශාන්ත මහතා
V. පී.එන්.ආර් ජයවික්‍රම මහතා
VI. එම්.එම්.යූ.බී සෙනෙවිරත්න මහතා
VII. ඩබ්ලිව්.එම්.ජේ වීරසිංහ මහතා
VIII. ඊ.එම්.ටී.බී වික්‍රමනායක මහතා
IX. ඩබ්ලිව්.එන්.බී.ආර් ප්‍රනාන්දු මහතා
X. කේ.ජී.එල් පෙරේරා මහතා
XI. පී.එච්.සී සිල්වා මහතා
XII. එම්.එම්.අයි.ආර් ප්‍රනාන්දු මහතා
XIII. ටී. ගුණරත්න මහතා
XIV. ආර්.ඒ.ඩී ඉන්ද්‍රනාත් මහතා
XV. ආර්.එම් සේනාරත්න මහතා
XVI. එම්.ඩී.පී සුනිල් ශාන්ත මහතා
XVII. එස්. සුසාදරන් මහතා
XVIII. එස්. ජයසීලන් මහතා
XIX. කේ. ධර්මසීලන් මහතා

➢ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක පී/2/24/77/98 හා 2005.09.04 දිනැති ලිපියෙන් පහත නම් සඳහන් සුරාබදු පරීක්ෂකවරුන් ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරට 2003.11.06 වන දින සිට පත් කරන ලදී.

I. පී.බී ධර්මකීර්ති මහතා
II. එච්.එච්.ඩී ජයවර්ධන මහතා
III. ඩී.එස් වසන්තසිරි මහතා
IV. ඩබ්ලිව්.එස්.ආර්.එෆ් ප්‍රනාන්දු මහතා
V. ඩබ්ලිව්.ඩී.එල් පත්මසිරි මහතා
VI. එස්. මදන්මෝහන් මහතා
VII. එස්. සෙන්තූර්සෙල්වන් මහතා
VIII. එස්.අයි රාමනායක මහතා
IX. එස්.කේ වනිගතුංග මහතා

## 6. මානව සම්පත් සංවර්ධනය:

පහත සඳහන් නිලධාරීන් සඳහා පුහුණු වැඩ සටහනන් පනාදරගම සුරාබදු අභ්‍යාස විද්‍යාලයේදී පවත්වන ලදී.

| | | |
|---|---|---|
| 2005.02.13 - 2005.02.17 දක්වා | : | උපදේශකයන් පුහුණු කිරීම |
| 2005.03.13 - 2005.03.17 දක්වා | : | සුරාබදු නියාමක පුහුණුව |
| 2005.04.25 - 2005.04.29 දක්වා | : | සුරාබදු නියාමකවරු පුහුණුව |
| 2005.05.08 - 2005.05.13 දක්වා | : | සුරාබදු පරීක්ෂක පුහුණුව |
| 2005.06.13 - 2005.06.17 | : | සුරාබදු පරීක්ෂක පුහුණුව |
| 2005.07.17 - 2005.07.21 | : | සුරාබදු නොවන රියදුරන් පුහුණුව |
| 2005.08.31 - 2005.09.02 | : | සුරාබදු රියදුරන් පුහුණුව |
| 2005.09.25 - 2005.09.29 | : | සුරාබදු නියාමක පුහුණුව |
| 2005.10.09 - 2005.10.14 | : | සුරාබදු සැරයන් මේජර්වරුන් පුහුණුව |
| 2005.10.14 - 2005.10.15 | : | සුරාබදු කාන්තා නිලධාරී පුහුණුව |
| 2005.10.16 - 2005.10.21 | : | සුරාබදු උවිඩ නිලධාරී පුහුණුව |

2005.11.06 - 2005.11.11 : සුරාබදු නියාමක පුහුණුව
2005.11.28 - 2005.12.02 : සුරාබදු නියාමක පුහුණුව
2005.12.08 - 2005.12.09 : සුරාබදු නියාමක පුහුණුව
2005.12.12 - 2005.12.16 : සුරාබදු සැරයන්වරු පුහුණුව
2005.12.19 - 2005.12.22 : සුරාබදු නියාමක පුහුණුව

## 7. යටිතල සංවර්ධනය (ගොඩනැගිලි/වාහන)

අ. කැස්බෑව සහ පාදුක්ක නගරවල සුරාබදු කාර්යාල පවත්වා ගෙන යාම පිනිස ස්ථිර ගොඩනැගිලි ඉදි කරන ලදී.

ආ. පහත සඳහන් ගොඩනැගිලිවල අළුත්වැඩියාවන් කටයුතු නිම කරන ලදී.

- බදුල්ල සුරාබදු කාර්යාල සංකීර්ණය
- පොලොන්නරුවේ යෝජිත සංචාරක බංගලා භූමිය වටා වැට ඉදි කිරීම
- අනුරාධපුර සුරාබදු අධිකාරී නිල නිවස
- කොළඹ 10, ඩී.ආර් විජේවර්ධන මාවතේ පිහිටි කොළඹ නගර කාර්යාලය
- කොළඹ 2, ස්ටේපල් වීදියේ පිහිටි සුරාබදු ප්‍රධාන කාර්යාලය

ආ. 2005 වසර තුල දී අළුතින් වාහන මිලදී ගැනීමක් සිදු නොවුන අතර, සංචිතයේ තිබෙන වාහනවල අදාල අළුත්වැඩියාවන් සිදුකරමින් පාවිච්චි කරන ලදී.

## 8. සුරාබදු ව්‍යුහය:

| | 2005.01.01 දින සිට | 2005.11.09 දින සිට | 2005.12.09 දින සිට |
|---|---|---|---|
| ඉක්ෂුපාක, තල් අරක්කු, පොල් සහ පදම් කල අරක්කු සම්මත ලීටරයකට | රු. 366/- | රු. 381/- | රු. 396/- |
| විදේශීය මත්පැන් සම්මත ලීටරයකට | රු. 490/- | රු. 510/- | රු. 525/- |
| මධ්‍යසාර ප්‍රතිශතය 5% ට අඩු බියර් තොග ලීටරයකට | රු. 27/50 | රු. 32/50 | රු. 37/50 |
| මධ්‍යසාර ප්‍රතිශතය 5% ට වැඩි බියර් තොග ලීටරයකට | රු. 43/50 | රු. 48/50 | රු. 53/50 |
| වයින් ලීටරයක් සඳහා | රු. 200/- | රු. 225/- | රු. 250/- |
| දුම්කොළ මත සුරා බද්ද කි.ග්‍රෑ එකකට | රු. 10/- | රු. 10/- | රු. 10/- |

මෑත වර්ෂවල දෙපාර්තමේන්තුවේ ආදායම් සහ වියදම් තත්ත්වය:

| වර්ෂය | ආදායම (රු. මිලියන) | වියදම (රු. මිලියන) |
|---|---|---|
| 1999 | 5735.000 | 109.000 |
| 2000 | 6219.625 | 120.000 |
| 2001 | 6240.385 | 148.097 |
| 2002 | 8537.430 | 151.395 |
| 2003 | 10719.444 | 146.415 |
| 2004 | 13545.000 | 173.000 |
| 2005 | 16120.785 | 211.933 |

13. **වර්ෂය තුලදී භාවිතා වූ මත්පැන් බලපත්‍ර වර්ග:**

අ.

| | | |
|---|---|---|
| ර.බි 1 | : | ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය සඳහා බලපත්‍රය |
| ර.බි ඒ | : | විදේශීය ස්ප්‍රීතු මෙරට නිෂ්පාදනය සඳහා බලපත්‍රය |
| ර.බි බී | : | කිරි පොන්ස සහ/හෝ වයින් නිෂ්පාදනය සඳහා බලපත්‍රය |
| ර.බි සී | : | රා හැර පොල් හෝ පොල් ආශ්‍රිත වෙනත් නිෂ්පාදිතයකින් පෙරන ලද ස්ප්‍රීතුවලින් විදේශ ස්ප්‍රීතු මෙරට සෑදීමට දෙන ලද බලපත්‍රය |
| ර.බි 3 | : | තොග වෙළඳ බලපත්‍රය |
| ර.බි 4 | : | සිල්ලරට විකුණුම් බලපත්‍රය |
| ර.බි 6 | : | බියර් පෝටර් බලපත්‍රය |
| ර.බි 7 | : | හෝටල් බලපත්‍රය |
| ර.බි 8 | : | හෝටල් පිඨිකා බලපත්‍රය |
| ර.බි 9 | : | විනෝද පිඨිකා බලපත්‍රය |
| ර.බි 10 | : | දුම්රිය භෝජනාගාර බලපත්‍රය |
| ර.බි 11 | : | ආපනාශාලා බලපත්‍රය |
| ර.බි 12 | : | තානායම් බලපත්‍රය |
| ර.බි 13 ඒ | : | ක්‍රීඩා සමාජ / සමාජශාලා බලපත්‍රය |
| ර.බි 14 | : | අවස්ථා බලපත්‍රය |
| ර.බි 15 | : | විකුණන වේලාවන් දීර්ඝ කිරීම සඳහා දෙන අතිරේක බලපත්‍රය |
| ර.බි 16 | : | වෙන්දේසිකරුවන්ගේ බලපත්‍රය |
| ර.බි 17 | : | පරිපාක ස්ප්‍රීතු බලපත්‍රය |
| ර.බි 18 | : | ඖෂධීය වයින් බලපත්‍රය |
| ර.බි 19 | : | විශේෂ බලපත්‍රය |
| ර.බි 22 ඒ | : | බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් සිල්ලරට විකිණීමේ බලපත්‍රය |
| ර.බි 22 බී | : | බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් ස්ථානීය පරිභෝජනය සඳහා බලපත්‍රය |

ආ. නිෂ්පාදනය බලපත්‍ර

පැසුනු නොපැසුනු මී රා මැදීම, බා ගැනීම සහ නිෂ්පාදනය කිරීමට දෙන බලපත්‍රය

- ස්කාගාර බලපත්‍රය
- විනාකිරි බලපත්‍රය
- ස්ප්‍රීතු ශෝධනය කිරීම සංයෝග කිරීම, පදම් කිරීම පිලිබඳ බලපත්‍රය

ඇ. රා එකතු කිරීම සඳහා බලපත්‍රය

- එකතු කරන ස්ථාන බලපත්‍රය

ඈ. බෝතල්ගත කිරීම සඳහා බලපත්‍රය

- පැසවූ මත්පැන්
- පෙරූ මත්පැන්

ඉ. සහාය බලපත්‍රය

ඊ. කිතුල් ගස් පැසුණු රා නිශ්පාදනය කර විකිණීමේ බලපත්‍රය

උ. විදේශ සංචාරක හෝටල් සහ ආපනශාලා බලපත්‍ර

| | |
|---|---|
| 'ඒ' ශ්‍රේණියේ හෝටල් | (ර.බි 7) |
| | (ර.බි 8) |
| 'බී' ශ්‍රේණියේ හෝටල් | (ර.බි 7) |
| | (ර.බි 8) |

'සී' ශ්‍රේණියේ හෝටල් (ර.බි 7)
(ර.බි 8)

'ඒ ' ශ්‍රේණියේ ආපනශාලා (ර.බි 11)
'බී' ශ්‍රේණියේ ආපනශාලා (ර.බි 11)
'සී' ශ්‍රේණියේ ආපනශාලා (ර.බි 11)

ශ්‍රේණිය නොසලකා සංචාරක මණ්ඩලය අනුමත කල ස්ථාන (ර.බි 22 බී)

ඌ ටෙන්ඩර් මගින් විකුණනු ලබන රා තැබෑරුම්

## 14. අදාල වර්ෂයේ මත්පැන් නිෂ්පාදකයෝ

1. සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා, අංක 110, නොරිස් කැනල් පාර, කොළඹ 10
2. සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සමාගම, වැලිසර, රාගම
3. සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලර්ස් සමාගම, කොතලාවල, කඩුවෙල
4. සීමාසහිත නිපොන් එක්ස්පෝ කම්පැනි, අංක 102, ශාන්ත ඇන්ඩෲ පාර, මෝදර, කොළඹ 15
5. සීමාසහිත ඒ.ර්.එෆ් (පුද්ගලික) සමාගම, මත්තුමගල, රාගම
6. සීමාසහිත මනෝරි ලංකා කම්පැනි, අංක 277/1, ජයමාලපුර, ගම්පොල
7. සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි, 3 වන සැතපුම් කණුව, පස්සර, බදුල්ල
8. සීමාසහිත රියෝ මාර්කටිං සර්විසස් (පුද්ගලික) සමාගම, අංක 7, පෙරුන්කුලිය මාවත, දංකොටුව
9. සීමාසහිත වයඹ ඩිස්ටිලරීස් ලංකා (පුද්ගලික) සමාගම, මල්කඩුවාව, කුරුණෑගල
10. සීමාසහිත ඇක්මී ලංකා කම්පැනි, අංක 73/1, පරණ පාර, හංවැල්ල
11. සීමාසහිත ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සහ සමාගම, මෙස්ටිය, වාද්දුව
12. සීමාසහිත පෙරිසිල් කම්පැනි, අංක 296/10, පාර්ක් පාර, කොළඹ 5
13. සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම, අංක 255/86, කොරතොට, කඩුවෙල
14. සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම, අංක 25/20, මහවත්ත පාර, එගොඩ උයන, මොරටුව
15. සීමාසහිත ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම, පස්සර පාර, විනීතගම, බදුල්ල
16. සමුපකාර ස්කාගාරය, පයාගල
17. හිඟුරාණ ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම, සමනබැද්ද, තිත්තපත්තර
18. තික්කම ඩිස්ටිලරීස්, අල්වායි, පේදුරුතුඩුව
19. වලිකාමම් ඩිස්ටිලරීස්, වංකානෙයි
20. ග්ලෝබ් බ්ලෙන්ඩර්ස් (පුද්) සමාගම, මල්කඩුවාව, කුරුණෑගල
21. සීමාසහිත මැකලම් බෲවරි (පුද්ගලික) සමාගම, පර්ල් වතුයාය, මීගොඩ
22. සීමාසහිත යුනයිටඩ් බෲවරි සමාගම, මාවතගම
23. සීමාසහිත ලයන් බෲවරි සමාගම, අංක 254, කොළඹ පාර, බියගම

## 15. නිෂ්පාදිත මත්පැන් ප්‍රමාණයන්

අ. මොලැසස් අරක්කු

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 222,840.000 | 82,517,467.50 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 538,648.548 | 228,941,307.78 |
| සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි | 40,983.000 | 15,051,642.00 |
| සීමාසහිත මනෝරි ලංකා සමාගම | 10,045.200 | 3,695,851.20 |
| සීමාසහිත රියෝ මාර්කටිං සර්විසස් පුද්ගලික සමාගම | 4,656.980 | 1,719,960.18 |
| ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 3,987.900 | 1,467,671.40 |
| වරනි | 1,046.070 | 393,067.72 |
| ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සහ සමාගම | 21,741.300 | 6,529,805.57 |
| හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 44,145.700 | 16,301,320.20 |
| තික්කම් ඩිස්ටිලරීස් | 44,938.900 | 16,695,806.40 |
| වලිකාමම් ඩිස්ටිලරීස් | 14,584.400 | 5,416,040.00 |

| | | |
|---|---|---|
| සීමාසහිත නිපොන් එක්ස්පෝ සමාගම | 1,048.414 | 383,719.52 |
| සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම | 4,534.400 | 1,667,568.90 |
| සීමාසහිත ඇක්මී ලංකා සමාගම | 6,900.000 | 2,571,754.50 |
| **එකතුව** | **960,100.812** | **383,352,982.87** |

ආ. පොල් සහ පදම් කල අරක්කු:

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා | 2,213,439.257 | 822,856,260.28 |
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 54,350.710 | 20,108,281.20 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 201,649.186 | 90,412,303.63 |
| සීමාසහිත මනෝර් ලංකා සමාගම | 1,986.800 | 736,345.80 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 340,066.546 | 125,592,562.01 |
| සීමාසහිත නිපොන් එක්ස්පෝ සමාගම | 14,310.900 | 5,273,817.90 |
| හිගුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 3,473.500 | 1,271,301.00 |
| සමුපකාර ස්කාගාරය | 3,556.925 | 1,347,007.05 |
| ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 10,011.855 | 3,724,704.18 |
| රියෝ මාර්කටිං සර්විසස් පුද්ගලික සමාගම | 702.100 | 258,879.30 |
| ඇක්මී ලංකා කම්පැනි | 8,276.600 | 3,047,775.60 |
| ඒ.ර්.එෆ් (පුද්ගලික) සමාගම | 484.916 | 177,479.26 |
| **එකතුව** | **2,852,309.295** | **1,074,806,717.21** |

ඇ. විශේෂ අරක්කු

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා | 26,748,790.524 | 9,872,363,506.41 |
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 353,931.000 | 130,433,729.40 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 2,436,203.966 | 863,250,138.78 |
| සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි | 133,043.030 | 49,468,168.98 |
| සීමාසහිත මනෝර් ලංකා සමාගම | 112,877.500 | 41,639,923.50 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 1,006,834.370 | 371,526,682.79 |
| සීමාසහිත නිපොන් එක්ස්පෝ සමාගම | 119,329.400 | 43,859,607.90 |
| සීමාසහිත වයඹ ඩිස්ටිලරීස් ලංකා (පුද්ගලික) සමාගම | 110,822.900 | 40,561,181.40 |
| හිගුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 75,496.700 | 28,014,059.70 |
| සමුපකාර ස්කාගාරය | 26,195.723 | 9,733,399.21 |
| ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 233,134.024 | 85,785,604.50 |
| ඒ.ර්.එෆ් (පුද්ගලික) සමාගම | 318,298.016 | 117,572,970.78 |
| සීමාසහිත රියෝ මාර්කටිං සර්විසස් පුද්ගලික සමාගම | 56,085.790 | 20,707,247.64 |
| සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම | 320,992.700 | 118,479,793.20 |
| සීමාසහිත ඇක්මී ලංකා සමාගම | 200,451.300 | 73,891,363.80 |
| සීමාසහිත පෙරසිල් පුද්ගලික සමාගම | 115,764.342 | 48,630,881.36 |
| **එකතුව** | **32,368,251.285** | **11,915,918,259.35** |

## 16. දේශීය නිෂ්පාදිත විදේශීය මත්පැන්

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 35,334.500 | 17,492,672.50 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 949,797.696 | 469,605,392.68 |

| | | |
|---|---|---|
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 725,798.086 | 358,989,178.41 |
| සීමාසහිත පෙරිසිල් පුද්ගලික සමාගම | 476,326.604 | 235,981,601.65 |
| සීමාසහිත නිපොන් එක්ස්පෝ සමාගම | 1,534.700 | 752,003.00 |
| හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 3,487.100 | 1,708,679.00 |
| ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගම | 84,051.510 | 41,239,855.13 |
| **එකතුව** | **2,276,330.196** | **1,125,769,382.37** |

## 17. ධාන්‍ය මත්පැන් (බියර්) මධ්‍යසාර ප්‍රතිශතය 5% ට අඩු

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලී) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| මැකලම් බෲවරි සමාගම | 1,053,713.995 | 29,838,887.97 |
| යුනයිටඩ් බෲවරි සමාගම | 2,170,545.600 | 61,949,892.00 |
| ලයන් බෲවරි සමාගම | 26,106,304.275 | 742,927,796.29 |
| **එකතුව** | **29,330,563.870** | **834,716,576.26** |

## 18. ධාන්‍ය මත්පැන් (බියර්) මධ්‍යසාර ප්‍රතිශතය 5% ට වැඩි

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලී) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| මැකලම් බෲවරි සමාගම | 947,421.630 | 41,219,583.60 |
| යුනයිටඩ් බෲවරි සමාගම | 2,644,496.400 | 117,712,377.90 |
| ලයන් බෲවරි සමාගම | 18,626,451.750 | 827,139,561.26 |
| **එකතුව** | **22,218,369.780** | **986,071,522.76** |

## 19 වයින්

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලී) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| ලංකා වයින් පුද්ගලික සමාගම | 6,023.300 | 1,312,717.80 |
| රනෝ සකේ | 293.775 | 98,755.32 |
| **එකතුව** | **6,317.075** | **1,411,473.12** |

## 20. බෝතල් රා නිෂ්පාදකයෝ

බෝතල් ගත රා නිෂ්පාදකයන්ගේ නම් ද, නිෂ්පාදිත ප්‍රමාණයන් සහ අය කර ගන්නා ලද බදු මුදල් ද පහතින් දක්වා ඇත.

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලී) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| රීගල් බෝතල් රා නිෂ්පාදනාගාරය | 458,610.000 | 110,066.40 |
| සිංහ බෝතල් රා නිෂ්පාදනාගාරය | 709,083.750 | 170,180.10 |
| කමාන්ඩර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 282,443.750 | 67,786.50 |
| නිව් කමාන්ඩෝ බෝතල් රා නිෂ්පාදකයෝ | 218,166.875 | 52,360.05 |
| ත්‍රී ලයන්ස් බෝතල් රා නිෂ්පාදකයෝ | 354,748.750 | 85,139.70 |
| මනෝර් ලංකා බෝතල් රා නිෂ්පාදකයෝ | 823,567.500 | 197,656.20 |
| ටී.එස්.ආර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 103,255.000 | 24,781.20 |
| වංකානෙයි තල් සංවර්ධන සමුපකාරය | 125,218.500 | 25,043.70 |
| හෝස් පවර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 361,307.500 | 86,713.80 |
| වයඹ සුපර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 40,155.000 | 96,370.20 |
| ගෝල්ඩන් රීගල් බෝතල් රා නිෂ්පාදනාගාරය, මාදම්පේ | 292,787.500 | 70,269.00 |
| රියෝ මාර්කටිං බෝතල් රා නිෂ්පාදනාගාරය | 437,896.000 | 65,684.40 |
| එම්පයර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 142,341.250 | 52,360.05 |
| ෂූටින් ස්ටාර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 272,460.000 | 65,390.40 |

| | | |
|---|---|---|
| සුපර් ස්ටාර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 12,202.000 | 2,928.60 |
| පයාගල පිරිසිදු පොල් රා බෝතල් නිෂ්පාදනාගාරය | 37,233.125 | 9,000.00 |
| ගෝල්ඩන් රිගල් බෝතල් රා නිෂ්පාදනාගාරය, කොළඹ | 45,420.000 | 10,900.00 |
| **එකතුව** | **4,716,896.500** | **1,192,630.300** |

## 21. ස්ප්‍රීතු

පොල් රා වලින් නිෂ්පාදනය කරන ලද ස්ප්‍රීතු

| ස්කාගාරය | ශුද්ධ රා ලීටර | නිෂ්පාදිත ස්ප්‍රීතු නිරපේක්ෂ මධ්‍යසාර ලීටර |
|---|---|---|
| සීදුව ස්කාගාරය | 19,090,489.100 | 1,428,435.400 |
| සමුපකාර ස්කාගාරය | 5,434,393.000 | 413,886.400 |
| බේරුවල් ස්කාගාරය | 5,072,055.000 | 386,712.300 |
| මෙස්ට්‍රිය ස්කාගාරය | 6,434,350.000 | 496,566.000 |
| රොක්ලන්ඩ් ස්කාගාරය | 4,947,558.000 | 373,152.200 |
| **එකතුව** | **40,978,845.100** | **3,098,752.300** |

තල් රා වලින් නිෂ්පාදනය කරන ලද ස්ප්‍රීතු

| ස්කාගාරය | ශුද්ධ රා ලීටර | නිෂ්පාදිත ස්ප්‍රීතු නිරපේක්ෂ මධ්‍යසාර ලීටර |
|---|---|---|
| වලිකාමම් ස්කාගාරය | 726,065.756 | 26,737.900 |
| තික්කම් ස්කාගාරය | 228,189.000 | 12,153.750 |
| වරණි ස්කාගාරය | 218,064.750 | 7,178.572 |
| **එකතුව** | **1,172,319.506** | **46,070.222** |

## 22. පරිපාක ස්ප්‍රීතු

| ස්කාගාරය | නිෂ්පාදන ප්‍රමාණය නිරපේක්ෂ මධ්‍යසාර ලීටර |
|---|---|
| සෙවනගල | 2,069,731.500 |
| පැල්වත්ත | 6,787,596.000 |
| **එකතුව** | **8,857,327.500** |

## 23. ස්වභාවය විකෘතිත ස්ප්‍රීතු ප්‍රමාණය

| ස්කාගාරය | නිෂ්පාදිත ප්‍රමාණය (ලීටර) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| පැල්වත්ත | 34,529.000 | 103,271.00 |
| **එකතුව** | **34,529.000** | **103,271.00** |

## 24. විනාකිරි නිෂ්පාදනය

බලපත්‍ර ලද ගස් ගණන, නිෂ්පාදිත විනාකිරි ප්‍රමාණය සහ විකුණුම් මිල (ඇ) පරිශිෂ්ඨයෙහි දැක්වේ.

## 25. දුම්කොළ බද්ද

2005 වර්ෂයෙහි නිකුත් කරන ලද දුම්කොළ ප්‍රමාණය සහ අදාල බදු මුදල මෙසේ ය.

| නිශ්පාදිත ප්‍රමාණය (කි.ග්‍රෑ) | බදු මුදල (රු. ශත) |
|---|---|
| 3,387,606.300 | 33,876,063.000 |

## 26. විශේෂ මෙහෙයුම් ඒකකයේ කාර්යයන්

### අ. කොළඹ ඒකකය

සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ අධීක්ෂණය යටතේ, සුරාබදු කොමසාරිස් (අපරාධ/පුහුණු) මගින් පාලනය වන, සුරාබදු අධිකාරීවරයෙකු යටතේ සුරාබදු ස්ථානාධිපති ඇතුළු සුරාබදු පරීක්ෂකවරුන් දෙදෙනෙකුගෙන් හා සෙසු නිලයන් දහඅට දෙනෙකුගෙන් සැදුම් ලත් කාර්යය මණ්ඩලයක් සේවයේ නියුතුව සිටී.

දිවයින පුරා පිහිටි අනෙකුත් සුරාබදු ස්ථානයන්ට අමතරව සියළු ප්‍රදේශයන් පුරා අපරාධ මර්දනය කිරීමේ වගකීම මෙම ඒකකයට පැවරී ඇත. ඒ අනුව, 2005 වර්ෂය තුල මෙම ඒකකය මගින් සිදු කල අපරාධ ග්‍රහණ සංඛ්‍යාව 2000 කි. බලපත්‍ර ස්ථාන තුල සිදු කරන ලද වැරදි සම්බන්ධ ග්‍රහණ සංඛ්‍යාව 316 කි. අපරාධ වැටලීම් තුලදී අන්තරාදායක ඖෂධ පණත යටතේ වන මත් ද්‍රව්‍ය වැටලීම් 14 ක් සිදු කර ඇති අතර, පුද්ගලයන් 28 දෙනෙකු අත්අඩංගුවට ගන්නා ලදී. මෙම වැටලීම්වලින්, ග්‍රහණයන් 03 ක් මහාධිකරණයට යොමු කල යුතු අධි චෝදනා වැරදිවලට අයත් වේ. මත්ද්‍රව්‍ය සඳහා භාවිත කරන ලද බහුදින ට්‍රෝලර් යාත්‍රාවක් සහ අති සුඛෝපභෝගී වෑන් රථයක් අත්අඩංගුවට ගන්නා ලදී. සුරා අපරාධ ග්‍රහණයේදී නීති විරෝධී මත්පැන් නිෂ්පාදනාගාර 178 කට අධික සංඛ්‍යාවක් වැටලීම් සිදුකර ඇති අතර, අපරාධ සම්බන්ධයෙන් ත්‍රි රෝද රථ ඇතුළු වාහන 11 කට අධික සංඛ්‍යාවක් අත්අඩංගුවට ගැනීමට නිලධාරීන් සමත් වී ඇත.

මෙම මෙහෙයුම්වලදී අත්අඩංගුවට පත්වූ සාක්ෂි ද්‍රව්‍ය අතරට, හෙරොයින් කිලෝ ග්‍රෑම් 02, ග්‍රෑම් 34, මිලි ග්‍රෑම් 800 ක් සහ අබිං ග්‍රෑම් 540, මිලි ග්‍රෑම් 800 ක්ද, ගංජා කිලෝ ග්‍රෑම් 1168 ක්ද, නීති විරෝධී ලෙස පෙරන ලද ස්ප්‍රීතු මි.ලී 131,983,350 විරෝධී ලෙස සාදන ලද මත්පැන් (ගෝඩා) මි.ලී 609,906.50 ක්ද ඇතුලත් වේ. අත්අඩංගුවට ගන්නා ලද බදු නොගෙවන සිගරට් ප්‍රමාණය 571980 ක් වේ.

2005 වර්ෂය තුලදී මෙම ඒකකය මගින් සිදු කරන ලද වැටලීම්වලින්, අපරාධ වාර්තා සම්බන්ධයෙන් රජයට අයකර දුන් දඩ මුදල රුපියල් 14,832,185/- කි. බලපත්‍ර ස්ථාන සම්බන්ධයෙන් සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් රජයට අයකර දුන් සමථ ගාස්තු මුදල රුපියල් 5,735,725/- කි.

2005 වසරේ දෙපාර්තමේන්තුව මගින් සිදු කල විශාලතම ගංජා වැටලීම සිදු කිරීමත්, විශාලතම හෙරොයින් ග්‍රහණය සිදු කිරීමටත්, නීති විරෝධී සිගරට් වැටලීම සිදු කිරීමටත්, එමගින් රජයට අයවිය යුතු විශාල මුදලක් රැක දීමටත්, වැඩිම වාහන සංඛ්‍යාවක් අත්අඩංගුවට ගැනීමටත් මෙම ඒකකයේ නිලධාරීන් සමත් වූ බවත්, එමගින් ඒකකයේ කාර්යය භාරය පිලිබඳ ජනතා ප්‍රසාදය ඉහල මට්ටමකින් පැවතුන බවත් පැහැදිලි වේ.

### ආ. මධ්‍යම පලාත් ඒකකය

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ සුරාබදු කොමසාරිස් අපරාධ හා පුහුණු , සහකාර සුරාබදු කොමසාරිස් (මධ්‍යම පළාත) යටතේ සහ අධීක්ෂණය යටතේ සුරාබදු ස්ථානාධිපති ඇතුළු එක් ප්‍රධාන සුරාබදු පරීක්ෂකවරයෙකු සහ එක් පරීක්ෂකවරයෙකු, සුරාබදු සැරයන්වරයෙකු, සුරාබදු නියාමකවරුන් සතර දෙනෙකු, සුරාබදු රියදුරෙකු ඇතුළු නිලධාරීන් අට දෙනෙකුගෙන් සැදුම් ලත් කාර්යය මණ්ඩලයක් සේවයේ නියුක්තව සිටී. 2003 වර්ෂයේ ස්ථාපිත මෙම ඒකකය එවකට මධ්‍යම, ඌව, උතුරු, උතුරු මැද හා නැගෙනහිර පළාත්වල සක්‍රිය රාජකාරියේ යෙදී ඇත. 2004 වසරේ සිට මෙම ඒකකය සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ නියෝග හා උපදෙස් පරිදි දිවයින පුරාම විශේෂිත රාජකාරීවල නියුක්තව සිටී.

2005 වසරේදී සුරා වැටලීම් 700 ක් සිදුකර පුද්ගලයින් 700 ක් අත් අඩංගුවට ගෙන දඩ මුදල් ලෙස රුපියල් දාහත් ලක්ෂ අසූ නවදහස් පන්සියයක් රජයට අයකර දී ඇත. මේ සඳහා නීති විරෝධී ලෙස පෙරීම් මධ්‍යස්ථාන 10 ක් හා අක්කර 25 ක පමණ කංසා වැටලීම්, ජාවාරම්කරුවන් අත් අඩංගුවට ගැනීම් ද ඇතුලත් වන අතර, බදු නොගෙවන ලද සිගරට් 1880 ක් අත් අඩංගුවට ගැනීම ද ඇතුලත් ය.

දිවයිය තුල බලපත්‍ර ස්ථාන 506 ක් කොන්දේසි කඩ කිරීම් සම්බන්ධයෙන් වැටලීම් කටයුතු කර කාර්මික අපරාධ වාර්තා 506 ක් ඉදිරිපත් කර ඇත. මින් රුපියල් අසූ හතර ලක්ෂ හැටහය දහස් පන්සිය හතලිහක සමථ මුදලක් රජයට අයකර දීමට සමත් වී ඇත.

2005 වර්ෂයේ මෙම ඒකකය මගින් දිවයින තුල විශාලම කංසා හේන් වැටලීම් 04 ක් සිදුකර ඇති අතර, එය මත්ද්‍රව්‍ය වැටලීම් සතිය තුල දිවයින තුල සිදු කරන ලද විශාලතම කංසා හේන් වැටලීම වන අතර, සුරාබදු ආඥා පනත, වස, විස, අබිං හා අන්තරාදායක ඖෂධ වර්ග ආඥා පනත, දුම්කොල බදු පනත ක්‍රියාත්මක කරමින් රජයට අයවිය යුතු විශාල මුදලක් අයකර දීමට මෙම ඒකකයේ නිලධාරීන් සමත්වී ඇත. එමගින් ඒකකය මගින් සිදු කරන ලද සමාජ මෙහෙවර සම්බන්ධයෙන් දිනෙන් දින ලැබෙන ජනතා ප්‍රසාදය ඉහල මට්ටමක පවතී.

## 27. නිශ්පාදන මෙහෙයුම් ඒකකයේ කාර්යයන්

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ සුරාබදු කොමසාරිස් (අපරාධ සහ පුහුණු) මගින් පාලනය වන මෙම ඒකකයේ ජ්‍යෙෂ්ඨ සුරාබදු පරීක්ෂකවරයෙක්, සුරාබදු පරීක්ෂකවරයෙක් . කෝප්‍රල්වරියක්, කාන්තා සුරාබදු නියාමිකාවක් සහ සුරාබදු රියදුරු කෝප්‍රල්වරයෙක් අනුයුක්තව ඇත.

මෙම ඒකකයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ, දිවයින පුරා විසිර පවතින සියළුම ස්කාගාර, අරක්කු, බියර්, රා සහ වයින් නිශ්පාදනාගාරවල නිශ්පාදන කාර්යයන් අධීක්ෂණය කිරීමත්, එමගින් සුරාබදු ආදායම අයකර ගැනීම සහ දිවයින පුරා පිහිටි තොග වෙළඳ බලපත්‍ර (රබි 03) පරීක්ෂාව සහ එහි පවතින වැරදි සම්බන්ධව කාර්මික අපරාධ වාර්ථා ඉදිරිපත් කිරීම මෙන්ම සුරාබදු නීතියට අනුකූලව ඒවා පාලනය විය යුතු ආකාරය සම්බන්ධව දැනුවත් කිරීමත් සහ නිරන්තර අධීක්ෂණයකට එම බලපත්‍ර ස්ථාන ලක් කිරීමත් ය.

තවද, මත්පැන් නිශ්පානාගාර හා ග්‍රහණ තොරතුරු සම්බන්ධව සංඛ්‍යා ලේඛණ පවත්වා ගෙන යාමත්, කාර්මික අපරාධ වාර්ථාවලට අදාල තැගි මුදල් ගෙවීම සඳහා කටයුතු කිරීමත් මෙම ඒකකයේ අධීක්ෂණය යටතේ සිදුකර ගෙන යනු ලබයි.

2005 වර්ෂය තුල ඉහත සඳහන් බලපත්‍ර ලත් ස්ථාන අධීක්ෂණය තුලින් පැවති වැරදි සම්බන්ධව කාර්මික අපරාධ වාර්ථා 13 ක් ඉදිරිපත් කර, ඒ සඳහා සමථ ගාස්තු බදු මුදල් සහ රාජ සන්තක කරන ලද ස්ප්‍රීතු විකිණීමෙන් රුපියල් 7,904,750/- ක ආදායමක් රජයට ලබා දී ඇත. ඉලක්ක ගතකර ඇති සුරාබදු ආදායම ලඟා කර ගැනිම සඳහා මෙම ඒකකය විසින් බදු ලබා ගන්නා බලපත්‍ර ස්ථාන නිරන්තර අධීක්ෂයට ලක් කිරීම තුලින් අපේක්ෂිත බදු ආදායම් ඉලක්කය සපුරා ගැනීමට ප්‍රමුඛව දායක වී ඇත.

## 28. මත්ද්‍රව්‍ය ඒකකයේ කාර්යයන්

වස විෂ අබිං හා අන්තරායකාරී ඖෂධ ආඥා පණත යටතේ නීතිය බලාත්මක කිරීම සඳහා පිහිටුවන ලද මත්ද්‍රව්‍ය ඒකකය කොළඹ ඩී.ආර් විජේවර්ධන මාවතේ ක්‍රියාත්මක වේ. සුරාබදු අධිකාරීවරයෙකුගේ අධීක්ෂණය යටතේ සුරාබදු ස්ථානාධිපතිවරයෙකු ඇතුළු නිලධාරීන් විසි දෙනෙකුගෙන් යුතු කාර්ය මණ්ඩලයක් මගින් මෙම ඒකකයේ කාර්යයන් මෙහෙයවනු ලබයි.

2005 වර්ෂයේදී ග්‍රහණ 720 ක් සිදුකර ඇති අතර, ඒ මගින් මත්ද්‍රව්‍ය අපරාධකරුවන් ලෙස පිරිමි 645 ක් හා ගැහැණු 75 ක් අත්අඩංගුවට ගෙන ඇත. මෙම ග්‍රහණ 720 න් 485 ක් හෙරොයින් සම්බන්ධවූ ඒවා වූ අතර, 215 ක් ගංජා සම්බන්ධ ග්‍රහණ විය. මෙම සියළු ග්‍රහණ සඳහා අධිකරණය ඉදිරියේ නඩු පැවරුනු අතර, දඩ මුදල් වශයෙන් රුපියල් 1,089,770/- ක් අයකර ගෙන ඇත.

මීට අමතරව, මෙම වර්ෂය තුලදී අක්කරයක කංසා හේන් ප්‍රමාණයක් ද විනාශ කරන ලදී. 2005 වර්ෂය තුල දී, හෙරොයින් ග්‍රෑම් 722 සහ මිලි ග්‍රෑම් 124 ක් ද, ගංජා කිලෝ ග්‍රෑම් 667 සහ ග්‍රෑම් 387 ක් අත් අඩංගුවට ගන්නා ලදී. තවද, මහේස්ත්‍රාත් අධිකරණය තුලින් විසඳූ නඩු සංඛ්‍යාව 680 ක් වන අතර, මහාධිකරණයට ඉදිරිපත් කල නඩු සංඛ්‍යාව 32 කි.

## 29. සුරා අපරාධ

සමාලෝචිත වර්ෂය තුල නීති විරෝධී මත්පැන් උවදුර මැඩලීම සම්බන්ධ වැටලීම් ප්‍රමාණය වැඩිවී ඇත. මෙම වර්ෂය තුලදී ග්‍රහණ 55220 ක් ඉලක්ක කර තිබූ අතර, ග්‍රහණ 45993 ක් සිදු කරන ලදී. දඩ මුදල් වශයෙන් රුපියල් 91,229,190/- ක මුදලක් අය කර ගෙන ඇත.

බලපත්‍රය අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට තරම් බරපතල නොවන කාර්මික අපරාධ සුරාබදු ආඥා පණතේ 56 වන වගන්තිය පරිදි සමථයකට පත් කරන ලදී. කාර්මික අපරාධ වාර්තා සමථ ගාස්තු වශයෙන් සමාලෝචිත වර්ෂයේ දී රුපියල් 42,956,610/- ක් අයකර ගෙන ඇත.

## 30. පහරදීම් හා අවහිර කිරීම්

2005 වර්ෂයේ දී රාජකාරියට එරෙහිව අවහිර කිරීම්, බාධා කිරීම් හෝ පහරදීම් පිලිබඳ සිද්ධීන් කිසිවක් වාර්තා වී නොමැත.

# සමාප්තිය

සමාලෝචිත වර්ෂය තුල දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද සුරාබදු ආදායම රුපියල් මිලියන 16120 කි. සිදු කරන ලද මුළු වැටලීම් සංඛ්‍යාව 45993 කි. මේ අනුව, අදාල වර්ෂය තුලදී දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවීම ගැන සතුටු වෙමි.

දෙපාර්තමේන්තුවේ සාර්ථකත්වයට හේතු වූයේ සීමිත සම්පත් මනා ලෙස උපයෝගී කර ගනිමින් හා විධිමත් මානව සම්පත් කළමණාකරණයක් තුලින්, මෙහෙයුම් ක්‍රියාවලියේ ඇතිකල ගුණාත්මක වර්ධනයයි.

ප්‍රතිපත්ති විධානයන් හා මාර්ගෝපදේශකත්වයන් සලසාදීමෙන් මාගේ ක්‍රියාකාරිත්වයට ශක්තිය ලබා දුන් ගරු මුදල් ඇමතිතුමාටත්, ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමාටත්, දෙපාර්තමේන්තුව නිසි මග මෙහෙයවීමෙන් හා මාගේ කාර්යභාරය සාර්ථක කර ගැනීමට ජවය ලබා දුන් මුදල් අමාත්‍යංශයේ ලේකම්වරයාටත්, සම්බන්ධීකරණය හා නිරන්තර උපදෙස් දීමෙන් බාධක මග හරවා ගැනීමට දායකවූ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරුන්ටත්, දෙපාර්තමේන්තුවේ කටයුතු සාර්ථක කර ගැනීමට නොයෙක් අයුරින් සහය දුන් මුදල් අමාත්‍යංශයේ සියළුම නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පුද කරමි.

දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය මට්ටමේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ලැබුන සහය අගය කරමි. තවද, දෙපාර්තමේන්තුව සමග සුහදව හා සමීපව කටයුතු කර, එහි පරමාර්ථ මුදුන් පත් කර ගැනීමට සහය දැක්වූ ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය, නීතිපති දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව හා අනෙකුත් රාජ්‍ය ආයතනයන්ට මාගේ කෘතඥ පූර්වක ස්තුතිය පුද කර සිටිමි.

අවසන් වශයෙන් මාගේ කටයුතු සාර්ථක කර ගැනීමට සහය වෙමින් දෙපාර්තමේන්තු අරමුණු මුදුන්පත් කර ගැනීමට දායකවූ දෙපාර්තමේන්තුවේ සියළුම ශ්‍රේණිවල නිලධාරීන්ට මාගේ විශේෂ ස්තුතිය හිමිවිය යුතුය.

(පරාක්‍රම ඒකනායක බණ්ඩාර)
සුරාබදු කොමසාරිස් ජනරාල්

-/විජේ